**බේරුවල ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජූනි 01 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 24 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූනි 19 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 **මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුවල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු.146,100 ක් වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ප්‍රාග්ධනිත කර තිබූ අතර එකතුව රු.271,900 ක් පොදු ගබඩා ලෙස තොග ශේෂයට ගෙන ගිණුම් ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුමට ගැලපීම් කළ යුතු එකතුව රු.678,835 ක් වූ ආදායම් හා එකතුව රු.215,677 ක් වූ වියදම් සමුච්චිත අරමුදල් ගිණුමට ගිණුම් ගත කර තිබුණි.

1.3.2 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.76,281,123 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදයම රු.29,377,303 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදයම රු.66,345,982 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 16,467 | 10,844 | 14,347 |
| (ii) බදු කුලී | 15,605 | 13,154 | 3,029 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,899 | 1,908 | -- |

2.2.2 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 18,862,985 |
| (ii) | මුද්දර ගාස්තු | 19,693,531 |

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>අවිධිමත් ගනුදෙනු</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව විසින් 2014 වර්ෂයේ විවිධ කාර්යයන් සඳහා සංග්‍රහ වියදම් වෙනුවෙන් රු.3,098,544 ක් වැය කර තිබූ අතර ඉන් රු.1,384,955 ක් අත්‍යවශ්‍ය රාජකාරි සඳහාද, රු.455,415 ක් විශේෂ රැස්වීම් සඳහාද, රු.443,894 ක් විශේෂ උත්සව කටයුතු සඳහාද රු.558,893 ක් සංග්‍රහ වියදම් සඳහාද ලෙස වවුචර්පත්වල සඳහන් කර තිබුණද නිශ්චිත වශයෙන්ම එම සංග්‍රහ වියදම යෙදවූ කාර්යය හා එය සිදු කළ දිනය සඳහන් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මහා සභා රුස්වීම් වාර 12 ක් සඳහා සංග්‍රහ වියදම් ලෙස රු.255,387 ක් වැය කර තිබුණි. මහ සභාව වෙනුවෙන් දිවා ආහාර පැකට් 65 ත්, 75 ත් අතර ප්‍රමාණයක් එක් සභා වාරයක් වෙනුවෙන් මිලදී ගෙන තිබූ අතර මහා සභාව වෙනුවෙන් සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද යන්න නිශ්චය කර ගත නොහැකි වුවද සභාවේ මුළු මන්ත්‍රීවරු සංඛ්‍යාව 22 ක් පමණක් විය.

(ඇ) යම් ආගමික, පුණ්‍ය, සංස්කෘතික, සෞඛ්‍ය, විනෝදාත්මක හෝ අධ්‍යාපන කාර්යයක් සම්බන්ධයෙන් එක් වර්ෂයකට මුළු එකතුව රු.1,000 කට වඩා වැඩි වියදමක් කරනු ලබන්නේ නම් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය අනුව ඒ සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මෙහෙයවීමෙන් පවත්වා තිබූ ජංගම සේවයේ සංග්‍රහ කටයුතු වෙනුවෙන් රු.79,280 ක්ද සභා අරමුදලින් ගෙවා තිබුණි.

3.2 **මෙහෙයුම්/කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ දිනපතා එකතු කරන කසල තුනී කිරීමේ කාර්යය සඳහා කුලී පදනම මත වේන් ලෝඩරයක් ලබාගැනීම සඳහා සභාව විසින් 2010 ජනවාරි සිට 2014 දෙසැම්බර් දක්වා රු.10,356,500 ක් ගෙවා තිබූ අතර වේන් ලෝඩරයක් ණය පදනම මත හෝ මිලදී ගැනීමට ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබුණි. එසේ වුවද, සභාව විසින් නව මාර්ග තලන යන්ත්‍රයක් රු.9,016,253 කට 2013 ජූලි 23 දින මිලදී ගෙන තිබුණි. මාර්ග තලන යන්ත්‍රයක් සභාව සතුව තිබියදී නව මාර්ග තලනයක් මිලදී ගැනීම තුළින් වේන් ලෝඩරයක් මිලදී ගැනීමේ අවශ්‍යතාවය නොසළකා හැර තිබුණි.

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 195 සිට 199 දක්වා වූ රීතිවලට අනුකූලව පාරිභෝජන ගබඩා ද්‍රව්‍ය ලේඛණ පවත්වා නොතිබුණි.

(ඇ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 203 හා 217 අනුව 2014 වර්ෂය සඳහා සභාවේ සම්පූර්ණ දේපල සම්බන්ධයෙන් පූර්ණ සමීක්ෂණයක්ද, සියළුම ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණයක්ද සිදු කර නොතිබුණි.

(ඈ) සභාවේ මුදල් ගෙවීම් කටයුතු, සැපයුම් සඳහා අත්තිකාරම් ලබාගැනීමේ කටයුතු, ලබා ගත් අත්තිකාරම්වලින් භාණ්ඩ මිලදී ගැනීම, ඒ සඳහා වවුචර්පත් ඉදිරිපත් කර අත්තිකාරම් පියවීම, ගබඩා භාරකරු ලෙස කටයුතු කිරීම යන රාජකාරි එකම නිලධාරියෙකුට පවරා තිබීම මගින් සභාවේ මූල්‍ය කටයුතුවල විනිවිදභාවයක් නොතිබූ අතර මෙය අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන්ද මතභේදාත්මක තත්වයක් විය.

(ඉ) සභාව සතු වාහන 23 ක ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) සුබසාධක කටයුතු සඳහා 2014 පෙබරවාරි 20 දින රු.107,000 කට මිලදී ගෙන තිබූ ජල ටැංකි 10 න් ජල ටැංකි 04 ක් එදින සිට විගණිත දිනය වූ 2015 පෙබරවාරි 25 වන විටත් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු භාරයේ තිබුණි.

(උ) 2014 නොවැම්බර් මාසයේදී දිවිනැගුම දෙපාර්තමේන්තුව මගින් සභාවට ලබාදී තිබූ GI බට 528 කින් විගණිත දිනය වූ 2015 අප්‍රේල් 07 දින වන විට බට 87 ක් පමණක් සභා ශාලාවේ තිබුණි. ඒ අනුව GI බට 441 ක ඌනතාවයක් විය. GI බට ලැබීම් හා නිකුත් කිරීම් තොග පොත්වලට හෝ වෙනත් කිසිදු ලේඛනයක සටහන් කර නොතිබුණි.

(ඌ) 2015 පෙබරවාරි 24 දින ගබඩා භාරකරු සමග ගබඩාවේ පැවති තොග අයිතම 06 ක් භෞතිකව පරීක්ෂා කිරීමේදී තොග ඒකක 283 ක අතිරික්තයක්ද, තොග ඒකක 76 ක ඌනතාවයක්ද විය.

3.3 **රාජකාරි නිවාස දුරකථන ගාස්තු**

2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2(v) ඡේදය ප්‍රකාරව දුරකථන බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමට අදාල අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවද, පළාත් පාලන ආයතන නිලධාරීන් සඳහා මෙම චක්‍රලේඛය යටතේ ගෙවීම් කිරීමට තවදුරටත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවත් එවැනි අනුමැතියක් ලබාගැනීමෙන් තොරව සභාවේ ලේකම්ගේ නිවාස දුරකථනය වෙනුවෙන් මාසිකව රු.4,000 ක සීමාව යටතේ 2014 සැප්තැම්බර් සිට විගණිත දිනය වූ 2015 ජනවාරි දක්වා රු.19,110 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. එසේම සභා අරමුදලින් රු.3,800 ක් වැය කර සභාවේ ලේකම් වෙත නිවාස දුරකථනයක්ද සපයා දී තිබුණි.

4. <u>**පද්ධති හා පාලන**</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) මානව සම්පත් කළමනාකරණය

(ඉ) වාහන පාලනය